**මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය නිලධාරි කොට්ඨාශය නැවත සකස් කිරීම**

1973 අගෝස්තු මස 01 වෙනි දින සිට මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය දෙකට බෙදා 'බිබිල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය' සහ 'මැදගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය' යනුවෙන් කොට්ඨාශ දෙකක් ඇති කළ බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

2. (අ) බිබිල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය පහත සඳහන් ග්‍රාම සේවක කොට්ඨාශවලින් සමන්විතවනවා ඇත :—

| කොට්ඨාශ අංකය | | නම |
|---|---|---|
| 96 | ... | කෙහෙල් අත්තාවෙල |
| 97 | ... | කොටගම |
| 98 | ... | යල් කුඹුර |
| 99 | ... | දොඩම්ගොල්ල |
| 100 | ... | බිබිල |
| 101 | ... | බොකාගොන්න |
| 102 | ... | වෑගම |
| 103 | ... | නිල්ගල |
| 103 ඒ | | හාමාපොල |

(ආ) මැදගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය පහත සඳහන් ග්‍රාම සේවක කොට්ඨාශවලින් සමන්විතවනවා ඇත :—

| කොට්ඨාශ අංකය | | නම |
|---|---|---|
| 106 | ... | හන්නපුරාව |
| 106ඒ | ... | කොටබෝව |
| 107 | ... | සේනාපතිය |
| 108 | ... | කෝන්ගොල්ල |
| 709 | ... | කොහුකුඹුර |
| 110ඒ | ... | බකිනිගහවෙල |
| 110බී | ... | පිටදෙනිය |
| 110සී | ... | කැන්දවින්න |
| 110ඩී | ... | මැදගම |
| 111 | ... | පුබ්බාර |

3. පහත සඳහන් ගම්සභා ඒ ඒ ප්‍රා.ආ.නි. කොට්ඨාශවලට අඩංගු වනවා ඇත :—

(අ) **බිබිල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය**
කොටගම ගම්කාර්‍ය සභාව සහ බිබිල ගම්කාර්‍ය සභාව.

(ආ) **මැදගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය**
මැදගම්පත්තු ගම්සභාව.

4. පහත සඳහන් ගම්බද උසාවි ඒ ඒ ප්‍රා. ආ. නි. කොට්ඨාශවල අධිකරණ බලපවත්වනවා ඇත :—

(අ) **බිබිල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය**
බිබිල ගම්සභා උසාවිය.

(ආ) **මැදගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය**
මැදමග සංචාරක ගම්බද උසාවිය.

5. පහත සඳහන් පාර්ලිමේන්තු ඡන්ද කොට්ඨාශ ඒ ඒ ප්‍රා.ආ.නි. කොට්ඨාශවලට අයත් වනවා ඇත :—

(අ) **බිබිල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය**
අංක 121 බිබිල මැතිවරණ කොට්ඨාශය (කොටසක්).

(ආ) **මැදගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය**
අංක 121 බිබිල මැතිවරණ කොට්ඨාශය (කොටසක්)

6. මෙම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශ කාර්යාලයන් පහත සඳහන් ස්ථානයන් හි පිහිටුවා ඇත :—

(අ) **බිබිල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය**
බිබිල-බදුල්ල පාරේ සැත. 3½ ක් බිබිලේ සිට යයුතුය. උණගොල්ල නම්වූ ප්‍රදේශයේ පිහිටා ඇත.

(ආ) **මැදගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය**
බිබිල-මොණරාගල පාරේ මැදගම නගරයේ පිහිටා ඇත.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ 7,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

10-440—73.10.12 දින අංක 81 දරන ගැසට් පත්‍රය

---

**පඩිපාලක සභා ආඥාපනත**

**නිවේදනයයි**

තේ සහ රබර් පිටරට යැවීමේ කර්මාන්ත පිළිබඳ පඩිපාලක සභාවල සාමාජිකයන් හැටියට 1973 ජූලි මස 31 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් තුළ පෙනී සිටීමට (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ කම්කරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව, 1973 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවසාය සංග්‍රහයේ 30 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1973 සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

**තේ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

**නම් නියමකොට පත්කෙරෙන සාමාජිකයන් :**

1. මහාචාර්ය ඒ. ඩී. වී. ද ඇස්. ඉන්ද්‍රරත්න මහතා
2. වී. ඇජ්. ගුණරත්න මහතා
3. ඩබ්ලිව්. ඇම්. නන්දිසේන මහතා

**සේව්‍ය නියෝජිතයන් :**

1. ඊ. ඇස්. අප්පදොරේ මහතා
2. ඇස්. කුමාරස්සාමි මහතා
3. ජී. ඇම්. ටොප්පෙන් මහතා
4. සී. වී. ඇල්. ගොඩ්වින් මහතා
5. ඇන්. ආර්. බී. රණසූරිය මහතා
6. ටී. ජී. ඇස්. සිත්තයියා මහතා
7. ඒ. ඇම්. ඇස්. අබ්බාස් මහතා
8. එච්. අබ්දුල් හුසේන් මහතා

**සේවක නියෝජිතයන් :**

1. ඇස්. පී. විල්බට් මහතා
2. ඩබ්ලිව්. කේ. ධම්දාස මහතා
3. ඇස්. ඒ. ජී. යාපා මහතා
4. ඇම්. සී. ඇම්. ෂාපි මහතා
5. ඇල්. ඩබ්ලිව්. පණ්ඩිත මහතා
6. තෝමස් කලුආරච්චි මහතා
7. ඔස්වින් ප්‍රනාන්දු මහතා
8. ඇම්. සෝමදාස මහතා

**රබර් පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

**නම නියමකොට පත්කෙරෙන සාමාජිකයන් :**

1. මහාචාර්ය ඒ. ඩී. වී. ද ඇස්. ඉන්ද්‍රරත්න මහතා
2. වී. ඇජ්. ගුණරත්න මහතා
3. ඩබ්ලිව්. ඇම්. නන්දිසේන මහතා

**සේව්‍ය නියෝජිතයන් :**

1. ඊ. ඇස්. අප්පදොරේ මහතා
2. ජේ. ඩබ්ලිව්. බී. පෙරේරා මහතා
3. ටී. මුර්ගේ සර් මහතා
4. එච්. ඇන්. ඒ. වික්‍රමරත්න මහතා
5. ඩී. ඇජ්. කලුආරච්චි මහතා
6. ජී. එච්. සුගතදාස මහතා
7. ජේ. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා

**සේවක නියෝජිතයන් :**

1. ඇල්. රොබට් ද සිල්වා මහතා
2. පබිලිස් වික්‍රමසිංහ මහතා
3. ඇම්. සී. ඇම්. ෂාපි මහතා
4. කේ. ඩී. මැන්දිස් මහතා
5. ඇල්. ඩබ්ලිව්. පණ්ඩිත මහතා
6. ජී. ඇම්. ජිනදාස මහතා
7. ඇස්. සිරිවර්ධන මහතා

10-439—73.10.12 දින අංක 81 දරන ගැසට් පත්‍රය

කො/875

යොමු අංකය : ―――――
6/3

**1972 අංක 1 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වන වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය**

කොළඹ 7, ග්‍රෙගරි පාරේ, අංක 31 දරණ නිවසේ පදිංචි, දොස්තර බර්ට්‍රම් ස්ටෙලිංටන් පෙරේරා මහතා විසින් පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලදින්, පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව එම කොමිෂන් සභාව විසින්, ව්‍යවස්ථාපිත බදු ගැණුම්කරුට අයිතිව තිබූ කෘෂිකාර්මික ඉඩම් වලින් ඔහුට තබා ගැනීමට ඉඩ දිය යුතු කොටස නිශ්චය කරමින් ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යවස්ථාපිත බදු ගැණුම්කරුට තබා ගැනීමට ඉඩදෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටස මෙහි උපලේඛන යෙහි දැක්වේ.

එස්. බී. සේනානායක,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

අංක සී 82,
ග්‍රෙගරි මාවත,
කොළඹ 7,
1973 සැප්තැම්බර් මස 29 දින,

උපලේඛනය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ නෙල්ලිය ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් අඳින ලද 1973.8.25 වන දින හා අවසාන ගම් පිඹුරු අංක 2489 හි අතිරේක 2 දරණ පිඹුරේ දැක්වෙන, වීගේන වත්ත නමැති ඉඩමේ අක්කර 50, රූඩ් 2, පර්චස් 20 ක් ප්‍රමාණයෙ ඇති අංක 193 දරණ බිම් කොටස හා එහි තුළ පිහිටි සියලු ගහ කොළ, පළතුරු සහ ගොඩනැගිලි ද වේ.

10–235—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය.

---

අංක ඔබ්. 105/35.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත, 4(1) වන වගන්තිය යටතේ නියෝගයයි**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමුකර දක්වා ඇති කාරණය පිළිබඳව ලංකා වතුසේවා සංගමය, අංක 13 කන්දෙ වීදිය, මහනුවර. එක් පාර්ශ්වයක් වශයෙන්, සහ අනෙක් පාර්ශ්වය වශයෙන්, කොළඹ 2, විටෝල්ස් එස්ටේට්ස් ඇන්ඩ් ඒජන්සීස් ලිමිටඩ් බාරේ, කොටගල රොසිටා වත්තේ අයිතිකරුවන් වන ද සිලෝන් ටී ප්ලාන්ටේෂන්ස් කොම්පණි ලිමිටඩ් සහ කොටගල, රොසිටා වත්තේ වතුපාලක අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද, කම්කරු ඇමති නැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග්‍ර කියවා) දරනපනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම් කරු වශයෙන් කම්කරු විනිශ්චය සභා අංක 10 හැටන් වෙත මෙසින් යොමු කරවනු ලැබේ.

එම්. පී. ද. ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 සැප්තැම්බර් මස 25 දින,
කොළඹ දීය.

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත

ලංකා වතුසේවා සංගමය,
අංක 13, කන්දෙ වීදිය,
මහනුවර, එක් පාර්ශ්වයක් වශයෙන් ද
සහ
අනෙක් පාර්ශ්වය වශයෙන්, කොළඹ 2, විටෝල්ස් එස්ටේට්ස් ඇන්ඩ් ඒජන්සීස් ලිමිටඩ් බාරේ, කොටගල රොසිටාවත්තේ අයිතිකරුවන් වන ද සිලෝන් ටී ප්ලාන්ටේෂන්ස් කොම්පැනි ලිමිටඩ් සහ කොටගල රොසිටා වත්තේ වතුපාලක.

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලකට හේතුවී ඇති කරුණු වනුයේ (ඉහත සඳහන් වෘත්තීය සමිතියේ සාමාජිකයෙක් වන) පී. නඩරාජා මහතාට 1971 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ඉහත සඳහන් කොටගල රොසිටා වත්තේ පාලක පක්ෂය විසින් නොගෙවීම යුක්ති සහගතද යන්නත් ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1973 සැප්තැම්බර් මස 21 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කායඹාලයේදී දින යොදන ලදි.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

10–242—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

අංක සී/අයි. 205.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත, 4(1) වන වගන්තිය යටතේ නියෝගයයි**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය, 457, යූනියන් පෙදෙස, කොළඹ 2. සහ එච්. දොන් කරෝලිස් ඇන්ඩ් සන්ස් ලිමිටඩ්, 64, කෙයිසර් ස්ට්‍රීට්, කොළඹ අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද, කම්කරු ඇමති නැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 5, පාක්වේ අංක 10 හි බී කොස්වත්ත මහතා වෙත මෙසින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද. ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 සැප්තැම්බර් මස,
කොළඹ දීය.

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත

සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය,
457, යූනියන් පෙදෙස, කොළඹ 2,
සහ
එච්. දොන් කරෝලිස් ඇන්ඩ් සන්ස් ලිමිටඩ්,
64, කේසිසර් ස්ට්‍රීට් කොළඹ 11,

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්න කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ, 1971 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වූ නව වැටුප් පරිමාව මත 1972 වර්ෂය වෙනුවෙන් ප්‍රසාද මුදල් ගෙවන ලෙස වෘත්තීය සමිතිය විසින් කර ඇති ඉල්ලීම යුක්ති සහගතද යන්නත්, ඔවුන්ට, කුමන සහනයක් හිමිද යන්නත් වේ.

1973 සැප්තැම්බර් මස 20 වැනිදා වූ මෙසින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

10–243—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

අංක: පී. 23/කො. 215/73.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගයයි**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණාව පිළිබඳව වී. කේ. චන්ද්‍රසෝම මහතා, අංක 4 1/1, පාක් වේ, කොළඹ 5 සහ ඩබ්ලිව්. ඇන්ඩ් පී. ඇවරි ලිමිටඩ්, 646, කොල්ලුපිටිය පාර, කොළඹ 3, අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිතවූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම් සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 5, ගවර්විදියේ අංක 26 හි නිව්ටන් එදිරිසිංහ මහතා වෙත මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 සැප්තැම්බර් මස 25 දින,
කොළඹ දී ය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

වී. කේ. චන්ද්‍රසෝම මහතා,
අංක 4 1/1, පාක් වේ,
කොළඹ 5 සහ

ඩබ්ලිව්. ඇන්ඩ් පී. ඇවරි ලිමිටඩ්,
646, කොල්ලුපිටිය පාර,
කොළඹ 3.

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

1. කොළඹ 3, ඩබ්ලිව්. ඇන්ඩ් පී. ඇවරි ලිමිටඩ්හි පාලක පක්ෂය විසින් වී. කේ. චන්ද්‍රසෝම මහතාගේ සේවය අවසන් කිරීම යුක්ති සහගතද යන්න සහ ඔහුට කුමන සහන යක් හිමිද යන්නත්,
2. ඩබ්ලිව්. ඇන්ඩ් පී. ඇවරි ලිමිටඩ්හි රක්ෂණ ක්‍රමය යටතේ තම භාර්යාවගේ වෛද්‍ය බිල්පත් ගෙවන ලෙස වී. කේ. චන්ද්‍රසෝම මහතා කරන ඉල්ලීම යුක්ති සහගතද යන්න සහ එසේනම් කුමන ප්‍රමාණයක් එවැනි වෛද්‍ය බිල් සඳහා ගෙවිය යුතුද යන්නත් පිළිබඳ වේ.

1973 සැප්තැම්බර් මස 21 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

10–416—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

අංක: ඩබ්ලිව්. 105/1477.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත, 4(1) වන වගන්තිය යටතේ නියෝගයයි**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව ලංකා වතු සේවා සංගමය, අංක: 13, කන්දේ වීදිය, මහනුවර, එක් පාර්ශ්වයක් වශයෙන් සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ, ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කොම්පැණි ලිමිටඩ් බාරේ, දික්ඔය, දික්ඔය වත්තේ අයිතිකරුවන් වන, දික්ඔය පී කොම්පැණි ලිමිටඩ් සහ දික්ඔය, දික්ඔය වත්තේ වතුපාලක අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක X හැටන් මණ්ඩලය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 ඔක්තෝබර් මස 01 වන දින,
කොළඹ දී ය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

එක් පාර්ශවයක් වශයෙන් ලංකා වතු සේවා සංගමය, අංක 13, කන්දේ වීදිය, මහනුවර

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කොම්පැණි ලිමිටඩ් බාරේ දික්ඔය, දික්ඔය වත්තේ අයිතිකරුවන් වන දික්ඔය පී කොම්පැණි ලිමිටඩ් සහ දික්ඔය, දික්ඔය වත්තේ වතුපාලක,

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

ආරවුලට හේතුව පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරාවුලට හේතුවී ඇති කරුණු නම්:

(1) 1962 ජනවාරි 1 වන දින සිට 1971 අගෝස්තු 31 වන දින දක්වා දික්ඔය, දික්ඔය වත්තේ ඩන්බර් කොටස භාර වතු කංකානම් වශයෙන් පී. ආර්. ඇලෙක්සැන්ඩර් මහතා කරන ලද සේවය පිළිබඳව, ලංකා වතු හිමියන්ගේ සම්මේලනයේ සාමාජික වතුවල කංකානම්වරුන්ට අදාලවන්නා වූ වැටුප් පරිමානය වන රු. 140—7.50 × 6—රු. 185 හි පිහිටුවා, වාර්ෂික වේතනාධිකයන්ද ඇතුලත්ව හිඟ වේතන ගෙවන ලෙස ලංකා වතු සේවක සංගමය එහි සාමාජික පී. ආර්. ඇලෙක්සැන්ඩර් මහතා (කේ. පී.) වෙනුවෙන් කරන ඉල්ලීම යුක්ති සහගතද?

(2) 1962 ජනවාරි 1 වන දින සිට 1971 අගෝස්තු 31 වන දින දක්වා කාලයෙහි පැය අටේ (8) වැඩකරන දිනයට වැඩිය වැඩ කරනලද සෑම වැඩකරන දිනයක් සඳහාම දිනකට පැය 2 ගණනේ පී. ආර්. ඇලෙක්සැන්ඩර් මහතාට අති කාල දීමනා ගෙවිය යුතුය යන ලංකා වතුසේවා සංගමයේ ඉල්ලීම යුක්ති සහගතද යන්න සහ ඇලෙක්සැන්ඩර් මහතාට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1973 සැප්තැම්බර් මස 25 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

10–460—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

අංක : පී. 23/කො. 611/72.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් පනත (විශේෂ විධිවිධාන) සමග කියැවෙන) දරන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 1973.08.31 දින අංක 75 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1973.08.16 වන දින දරණ නියෝගයෙන් එන්. ආර්. පෝල් මහතා, 154, මෝදර වීදිය, කොළඹ 15 සහ සිනිමාස් ලිමිටඩ්, 117, අලුත්හෙට්ටි වීදිය, කොළඹ 13, අතර ඇති 1973.08.11 දින දරණ ආරවුල පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා ආර්. ආර්. නල්ලයියා මහතා, 16, බෝගල කෝට්ස්, හැව්ලොක්ටවුම කොළඹ 5 වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතුයැයි දැන් පෙනීයන හෙයින්, කම්කරු ඇමති වන මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, එකී නියෝගය අවලංගු කරන අතර, එකී 1973. 08. 16 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 ඔක්තෝබර් මස 01 දින,
කොළඹ දී ය.

10–459/1—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

අංක : පී. 23/කො. 611/72.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගයට අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කරුණ පිළිබඳව එන්. ආර්. පෝල් මහතා, 154, මෝදර වීදිය, කොළඹ 15 සහ සිනිමාස් ලිමිටඩ්, 117 අලුත්හෙට්ටි වීදිය, කොළඹ 13, අතර කාර්මික ආරවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරණ පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1)වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, නුගේගොඩ, පාගොඩ පාරේ, අංක 18 හි, ජේ. ජී. ඇල්. ස්වාරිස් මහතා වෙත මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 ඔක්තෝබර් මස 01 දින,
කොළඹ දී ය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

එන්. ආර්. පෝල් මහතා, 154, මෝදර වීදිය, කොළඹ 15,
සහ
සිනිමාස් ලිමිටඩ්, 117, අලුත්හෙට්ටි වීදිය, කොළඹ 13,

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණු නම් :

1. එන්. ආර්. පෝල් මහතාට සිනිමාස් ලිමිටඩ්හි පාලක පක්ෂය විසින් 1971, 1972, 1973 යන වර්ෂයන් සඳහා වාර්ෂික වේතනාධික යන් නොගෙවීම යුක්තිසහගතද යන්න සහ කුමන සහනයක් ඔහුට හිමිද,

2. එන්. ආර්. පෝල් මහතාට සිනිමාස් ලිමිටඩ්හි පාලක පක්ෂය විසින් 1972 දෙසැම්බර් මාසයේදී ප්‍රසාද දීමනා නොගෙවීම යුක්ති සහගදත යන්න සහ කුමන සහනයක් ඔහුට හිමිද, සහ

3. එන්. ආර්. පෝල් මහතාට සිනිමාස් ලිමිටඩ්හි පාලක අධ්‍යක්ෂ විසින් සලසනලද ආකාරයට, පෝල් මහතා විසින් කොළඹ, පෝටෝ සිනා ලිමිටඩ් වෙත ගණකාධිකාරිවරයෙකු වශයෙන් කරන ලද සේවය සඳහා සිනිමාස් ලිමිටඩ්හි පාලක පක්ෂය විසින් වේතන නොගෙවීම යුක්ති සහගතද සහ ඔහුට කුමන සහනයක් හිමිද යන කරුණු වේ.

1973 සැප්තැම්බර් මස 18 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

10–459/2—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

අංක : ඩබ්ලිව්. 105/282.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගයට අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව ලංකා වතු සේවා සංගමය, 13, කන්දේ වීදිය, මහනුවර සහ අමරසූරිය ලිමිටඩ් බාරේ හෙන්රි වුඩ්වර්ඩ් අමරසූරිය එස්ටේට්ස් ලිමිටඩ්, 341, යුනියන් පෙදෙස, කොළඹ 2, අතර කාර්මික ආරවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරණ පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1)වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක III—මහනුවර වෙත මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 ඔක්තෝබර් මස 01 දින,
කොළඹ දී ය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

ලංකා වතු සේවා සංගමය,
අංක : 13, කන්දේ වීදිය, මහනුවර,

සහ අමරසූරිය ලිමිටඩ් බාරේ, හෙන්රි වුඩ්වර්ඩ් අමරසූරිය එස්ටේට්ස් ලිමිටඩ්, 341, යුනියන් පෙදෙස, කොළඹ 2,

අතර පවතින කාර්මිකආරවුලක් පිළිබඳවයි.

ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණු නම්, ලංකා වතු සේවා සංගමය විසින් එම සංගමයේ සාමාජික එස්. එම්. ඔවිටිමුල්ල මහතා වෙනුවෙන් එච්. ඩබ්ලිව්. අමරසූරිය එස්ටේට්ස් ලිමිටඩ් පාලන-පක්ෂයෙන් කෙරෙන ඉල්ලීම් යුක්ති සහගතද යන්නත්, එස්. එම්. ඔවිටිමුල්ල මහතාට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

(i) අක්මීමන සිට්‍රස් වතුයායේ ජ්‍යෙෂ්ඨ කර්මාන්තශාලා නිලධාරි එස්. එම්. ඔවිටිමුල්ල මහතා, 1965 අංක 5 දරන සාමූහික ගිවිසුම අනුව 1967. 7. 1 වන දින සිට 4 වන ශ්‍රේණියෙහි තැබිය යුතුව තිබුණු අතර, ඒ අනුව 1967. 7. 1. වන දින සිට 1968.3.31 දින දක්වා හිඟ වැටුප් මුදල්, අතිකාල දීමනා සහ අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) ඉහත (i) හි සඳහන් කර ඇති පදනමට වඩා අවාසිදායක නොවන්නාවූ ප්‍රමාණයන්ට එච්. ඩබ්ලිව්. අමරසූරිය එස්ටේට්ස් ලිමිටඩ් විසින් එස්. එම්. ඔවිටිමුල්ල මහතා පහත දක්වන සමාගමේ වතුවලට මාරුකරන ලදුව, ඔහු විසින් සහකාර කර්මාන්තශාලා නිලධාරි වශයෙන් කරන ලද සේවය සඳහා වේතන, අතිකාල දීමනාද, අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් නොකඩවා ගෙවීමද කළ යුතුය.

1968 අප්‍රේල් 1 වන දින සිට 1969 පෙබරවාරි 28 දක්වා—හෝම්වුඩ්වත්ත, ආගරපතන.

1969 මාර්තු 1 වන දින සිට 1971 සැප්තැම්බර් 30 දක්වා—පෙන්රෝස් වතුයාය, ගල්බොඩ,

1971 ඔක්තෝබර් 1 වන දින සිට 1973 ජනවාරි 31 දක්වා—අලකොල්ල වතුයාය, මඩොල්කැලේ:

1973 සැප්තැම්බර් මස 24 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

10–475—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

අංකය : සී.අයි.ආර්./163/73.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් පනත (විශේෂ විධිවිධාන) සමග කියැවෙන) දරන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරවුල් පනතෙ, 4 (1) වන වගන්තිය යටතේ 1973 මැයි මස 11 දින අංක 59 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1973 අප්‍රේල් මස 24 වන දින දරන නියෝගයෙන් එක් පාර්ශවයක් වශයෙන්, කොළඹ 3, සැන්ට කිල්ඩාස්, පටුමගේ 12 හි, සී. ජී. වෙල්ලයියා මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් (1) උඩුපුස්සැල්ලාව, ගෝඩන් වත්තේ, අයිතිකරුවන් වන කොළඹ 1, රැජින වීදියේ 14 හි, ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කම්පැණි ලිමිටඩ් බාරේ, ද ස්ටැන්ඩඩ් ටී කම්පැණි ඔෆ් සිලෝන් ලිමිටඩ් සහ (2) ද ස්ටැන්ඩ් ටී කම්පැණි ඔෆ් සිලෝන ලිමිටඩ් හි ඒජන්තවරුන් වන කොළඹ 1, රැජින වීදියේ, 14 හි, ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කම්පැණි ලිමිටඩ්.

අතර ඇති 1973 අප්‍රේල් මස 03 දින දරන ආරවුල පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා ගල්කිස්සේ පිරිවෙන පාරේ, අංක 54 හි, පදිංචි අද්වකාත්, ජී. ඩබ්. එදිරිවීර මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතුයැයි දැන් පෙනීයන හෙයින්, කම්කරු ඇමති මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, එකී නියෝගය අවලංගු කරන අතර, එකී 1973 අප්‍රේල් මස 24 දින දරණ නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 සැප්තැම්බර් මස 27 දින,
කොළඹ දීය.

10–241/1—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

අංකය: සීඅයිආර්/163/73

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය, (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව, එක් පාර්ශවයක්, කොළඹ 3, සැන්ට්කිල්ඩාස් පටුමගේ, 12 හි, සී. ජී. වෙල්ලයියා මහතා හා අනෙක් පාර්ශවය වශයෙන්, (1) උඩපුස් සැල්ලාව, ගෝඩන් වත්තේ, අයිතිකරුවන් වන කොළඹ 1, රැජින වීදියේ 14 හි, ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කම්පැණි ලිමිටඩ් බාරේ, ද ස්ටැන්ඩඩ් ටී කම්පැණි ඔෆ් සිලෝන් ලිමිටඩ් සහ (2) ද ස්ටැන්ඩඩ් ටී කම්පැණි ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ඒජන්තවරුන් වන කොළඹ 1, රැජින වීදියේ, 14 හි ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කම්පැණි ලිමිටඩ්.,

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක: 14 හා 1957 අංක 62 හා 1962 අංක 4හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 5, ගවර් වීදියේ, 26 හි නිව්ටන් එදිරිසිංහ මහතා මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 සැප්තැම්බර් මස 27 දින,
කොළඹ දීය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

එක් පාර්ශවයක් වශයෙන්, කොළඹ 3, සැන්ට්කිල්ඩාස් පටුමගේ, 12 හි, සී. ජී. වෙල්ලයියා මහතා හා අනෙක් පාර්ශවය වශයෙන්, (1) උඩුපුස්සැල්ලාව, ගෝඩන් වත්තේ අයිතිකරු වන, කොළඹ 1, රැජින වීදියේ 14 හි, ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කම්පැණි ලිමිටඩ් බාරේ ද ස්ටැන්ඩඩ් ටී කම්පැණි ඔෆ් සිලෝන් ලිමිටඩ් සහ (2) ද ස්ටැන්ඩඩ් ටී කම්පණි ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ඒජන්තවරුන් වන කොළඹ 1, රැජින වීදියේ, 14 හි, ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කම්පණි ලිමිටඩ්.

අතර කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශවයන් අතර, ආරවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ, උඩුපුස්සැල්ලාව, ගෝඩන් වත්තේ පාලක පක්ෂය විසින් උඩුපුස්සැල්ලාව ගෝඩන් වත්තේ සහකාර වතුපාලක, සී. ජී. වෙල්ලයියා මහතා ගේ සේවය අවසන් කිරීම යුක්ති සහගත ද යන්න හා ඔහුට කුමන සහනයක් හිමිවිය යුතු ද යන්නත් පිළිබඳව වේ.

1973 සැප්තැම්බර් මස 17 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

10–241/2—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

අංක සීඅයිආර්/590/72.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් පනත (විශේෂ විධිවිධාන) සමග කියැවෙන) දරන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 1972 දෙසැම්බර් මස 01 දින අංක 36 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1972 නොවැම්බර් මස 16 වන දින දරන නියෝගයෙන් එක් පාර්ශවය වශයෙන් මාතලේ, මහවෙල, "රෝස්මාකි" හි, සී. එච්. සී. ද රන් මහතා සහ අනික් පාර්ශවය වශයෙන් (1) මස්කෙළිය, කුවීන්ස්ලන්ඩ් වත්තේ අයිතිකරුවන් වන කොළඹ 3, කොල්ලුපිටිය පාරේ, 363 හි, ෂෝ වොලස් ඇන්ඩ් හෙජස් ලිමිටඩ් බාරේ, පාමස්ටන් ටී කොම්පැණි ලිමිටඩ් සහ (2) පාමස්ටන් ටී කොම්පැණි ලිමිටඩ් වෙනුවෙන් ඒජන්තුවරුන් වන කොළඹ 3, කොල්ලුපිටිය පාරේ, 363 හි ෂෝ වොලස් ඇන්ඩ් හෙජස් ලිමිටඩ්.

අතර ඇති 1972 නොවැම්බර් මස 9 වන දින දරන ආරවුල පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක X හැටන් වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතුයැයි දැන් පෙනීයන හෙයින්, කම්කරු ඇමති වන මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, එකී නියෝගය අවලංගු කරන අතර, එකී 1972 නොවැම්බර් මස 16 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 සැප්තැම්බර් මස 25 වන දින,
කොළඹ දී ය.

10–240/1—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

අංකය සීඅයිර්/590/72.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය, (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගග අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව, එක් පාර්ශවයක් වශයෙන්, නුගේගොඩ, මිරිහාන පාරේ, 55 හි, සී. එච්. සී. ද රන් මහතා සහ අනිත් පාර්ශවය වශයෙන් (1) මස්කෙළිය, කුවින්ස්ලන්ඩ් වත්තේ අයිතිකරුවන් වන කොළඹ 3, කොල්ලුපිටිය පාරේ, 363 හි, ෂෝ වොලස් ඇන්ඩ් හෙජස් ලිමිටඩ් බාරේ, පාමස්ටන් ටී කොම්පැණි ලිමිටඩ් සහ (2) පාමස්ටන් ටී කොම්පැණි ලිමිටඩ් වෙනුවෙන් ඒජන්තවරුන් වන කොළඹ 3, කොල්ලුපිටිය පාරේ, 363 හි ෂෝ වොලස් ඇන්ඩ් හෙජස් ලිමිටඩ් අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද, කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක II කොළඹ වෙත මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද සොයිසා සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 සැප්තැම්බර් මස 25 වන දින,
කොළඹ දී ය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරය—කාර්මික ආරවුල් පනත**

එක් පාර්ශවයක් වශයෙන් නුගේගොඩ, මිරිහාන පාරේ, 55 හි සී. එච්. සී. ද රන් මහතා

සහ

අනික් පාර්ශවය වශයෙන්

(1) මස්කෙළිය, කුවින්ස්ලන්ඩ් වත්තේ අයිතිකරුවන් වන කොළඹ 3, කොල්ලුපිටිය පාරේ, 363 හි ෂෝ වොලස් ඇන්ඩ් හෙජස් ලිමිටඩ් බාරේ, පමාස්ටන් ටී කොම්පැණි ලිමිටඩ් සහ (2) පාමස්ටන් ටී කොම්පැණි ලිමිටඩ් වෙනුවෙන් ඒජන්තවරුන් වන කොළඹ 3, කොල්ලුපිටිය පාරේ, 363 හි ෂෝ වොලස් ඇන්ඩ් හෙජස් ලිමිටඩ් අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ මස්කෙළිය කුවින්ස්ලන්ඩ් වත්තේ පාලක පක්ෂය විසින් සී. එච්. සී. ද රන් මහතා සේවයෙන් පහකිරීම යුක්ති සහගතද යන්න හා ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.

1973 සැප්තැම්බර් මස 17 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

10–240/2—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

## මිළ පාලන දැන්වීම්

**පීඇල්. 5/73 දරණ ආහාර මිළ නියෝගය** **කිරිඟු පිටි**

**මිළ පාලන පනත**

**නියෝගය**

පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත්, ෂර්ලි රෙජිනෝල්ඩ් විලියම් පෙරේරා අමරසිංහ වන මම (173 අධිකාරය වන) මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු 4 වන වගන්තිය යටතේ මා වෙත පැවරීත් ඇති බලතල අනුව—

(i) 1973 ජූනි මස 29 වෙනි දින අංක 66 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද 1973 ජූනි මස 14 වෙනි දින අංක : පීඇල් 3/73 දරණ ආහාර මිළ නියෝගය මේ දුන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(ii) මීට යා කර ඇති උප ලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් වී ඇති මිළ ගණන් මේ දුන් සිට එම උප ලේඛනයේ 1 වන තීරයේ සඳහන් ප්‍රදේශය තුළ කිරිඟු පිටි ශුද්ධ බර රාත්තල් 148 ක ප්‍රමාණයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම තොග මිළ ගණන් බව මෙම නියෝග යෙන් නියම කරමි.

(iii) මීට යා කර ඇති උප ලේඛනයේ 3 වන තීරයේ සඳහන් වී ඇති මිළ ගණන් මේ දුන් සිට, එම උප ලේඛනයේ 1 වන තීරයේ සඳහන් ප්‍රදේශය තුල කිරිඟු පිටි ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(iv) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) කිරිඟු පිටි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීමක් හෝ කිරිඟු පිටි වරකට ශුද්ධ බර රාත්තල් 148 ක ප්‍රමාණයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්;

(ආ) පාරිභෝගය හෝ පාවිච්චිය පිණිස කිරිඟු පිටි ශුද්ධ බර රාත්තල් 148 කට අඩුව විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්;

(ඇ) කිරිඟු පිටි හා ඉරිඟු පිටි එකට මිශ්‍ර කළ විට එය ''කිරිඟු පිටි'' නමින් හැඟවෙන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(ඈ) කිරිඟු පිටි තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තල් 148 කට අඩු හෝ වැඩි ඕනෑම ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන්ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර රාත්තල් 148 ක් තොග වශයෙන් විකිණිය යුතු වැඩිම මිලේ අනුපාතය අනුව වැටහෙන මිළ අනුව බවත්;

මෙම නියෝගයෙන් නියම කරමි.

(v) තවද, කිරිඟු පිටි, ඉරිඟු පිටි හැර වෙන කිසියම් ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බවද, මෙයින් නියම කරමි.

(vi) තවද, බරින් සියයට 10 කට වැඩියෙන් ඉරිඟු පිටි මිශ්‍ර කරන ලද කිරිඟු පිටි කිසිවකු විසින් නොවිකිණිය යුතු බවද මෙම නියෝගයෙන් නියම කරමි.

(vii) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක හෝ කිරිඟු පිටි සිය ස්වාමිත්වය යටතේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම කිරිඟු පිටි ප්‍රමාණයන් සුදුසු භාජනයක තබා එම ආහාර ද්‍රව්‍යය සඳහා මෙම නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධකොට එම කිරිඟු පිටි සහ එම මිළ ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බවද නියම කරමි.

(viii) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා ''රාත්තල'' නොහොත් ''රා'' යන්නෙන් අදහස් කරනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව, සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(ix) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් කිරිඟු පිටි විකුණන සෑම තැනැත්තෙකුම විසින් මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ කිරිඟු පිටි වල ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ කිරිඟු පිටි සඳහා ගෙවූ මුදල; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන් ද, සිල්ලර වශයෙන් ද යන වග ඇතුලත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද ;

නියම කරමි.

(x) තවද, කිරිඟු පිටි විකිණීමේදී එම කිරිඟු පිටි යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහාලනු ලැබේ නම් එහි මිළත් එම නියෝගයෙන් නියම කරනු ලැබූ වැඩිම මිළ ගණන්වලට ඇතුලත් වන බව ද නියම කරමි.

1973 සැප්තැම්බර් මස 30 වෙනි දින පෙ.ව. 10.00 ට පොලොන්නරුව දිසාපති කාර්යාලයේ දී අත්සන් කරන ලදී.

එස්. ආර්. ඩබ්ලිව්. පි. අමරසිංහ,
පොලොන්නරුව දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක.

**උපලේඛන 1—සළාක සඳහා පාරිභෝගිකයනට කිරිඟු පිටි නිකුත් කිරීම**

| 1 වන තීරය<br>ප්‍රදේශය | 2 වන තීරය<br>ශුද්ධ බර රාත්තල් 148 ක මිටියක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වන තීරය<br>ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කය ... ... ... ... | 104 53 | 0 72 |

**උපලේඛන 2—බේකරි සහ විශේෂ බලපත්‍ර සඳහා කිරිඟු පිටි නිකුත් කිරීම**

| 1 වන තීරය<br>ප්‍රදේශය | 2 වන තීරය<br>ශුද්ධ බර රාත්තල් 148 ක මිටියක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වන තීරය<br>ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කය ... ... ... ... | 125 25 ... | 0 86 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය හැකි නියමිත මිළ නොවේ. මේවා ඉහත සඳහන් ද්‍රව්‍යයන් ගේ උපරිම මිළ ගණන් වේ. මේ ද්‍රව්‍ය මේ මිළට ඉහළින් විකිණීම නොකළ යුතුයි.

10–280/1—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

**පීඇල්. 4/73 දරණ ආහාර මිළ නියෝගය** පාන්

**මිළ පාලන පනත**

**නියෝගය**

පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත්, ෂර්ලි රෙජිනෝල්ඩ් විලියම් පෙරේරා අමරසිංහ වන මම (173 අධිකාරය වන) මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු 4 වන වගන්තිය යටතේ මා වෙත ජැවරි ඇති බලතල අනුව—

(i) 1973 ජූනි මස 29 වෙනි දින අංක 66 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද 1973 ජූනි මස 14 වෙනි දින දරණ අංක : පීඇල් 2/73 දරණ ආහාර මිළ නියෝගය මේ දුන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(ii) මීට යා කර ඇති උපලේඛනයේ 2 වන සහ 3 වන තීරවල සඳහන් මිළ එම උපලේඛනයේ 1 වන තීරයේ සඳහන් ප්‍රදේශය තුල, පිළිවෙලින් අවුන්ස 16 සහ අවුන්ස 8 පාන් ගෙඩි මේ දුන් සිට විකිණිය හැකි වැඩිම මිළ බවත්, එකී මිළට වැඩියෙන් එම ප්‍රදේශය තුල එම පාන් ගෙඩි නොවිකිණිය යුතු බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

(iii) තවද, මෙම මිළ නියෝගයෙන් කිසියම් ප්‍රදේශයක් සඳහා අවුන්ස 16 පාන් ගෙඩියකට නියමිත වැඩිම මිලේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන් එම ප්‍රදේශය තුල අවුන්ස 8 කට වඩා බර පාන් ගෙඩියක් හෝ පාන් ගෙඩියකින් අවුන්ස 8 කට වඩා බර කිසියම් කොටසක් හෝ නොවිකිණිය යුතු බවත් ;

(iv) මෙම මිළ නියෝගයෙන් කිසියම් ප්‍රදේශයක් සඳහා අවුන්ස 8 පාන් ගෙඩියකට නියමිත වැඩිම මිලේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන් එම ප්‍රදේශය තුල අවුන්ස 8 කට ඩවා බර නොවූ පාන් ගෙඩියක් හෝ පාන් ගෙඩියකින් අවුන්ස 8 කට වඩා බර නොවූ කිසියම් කොටසක් හෝ නොවිකිණිය යුතු බවත් ;

(v) පාන් විකුණන විට ඔතා දෙනු ලබන දෙයක් වෙතොත් එහි මිළ මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන්වලට ඇතුලත් බවත් ;

(vi) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කොට ඇති සෑම ප්‍රදේශයකම සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ කිසියම් ස්ථානයකු හෝ වාහනයක පාන් ඇති වෙළෙන්දෙකු මෙම නියෝගයෙන් පාන් සඳහා නියමිත වැඩිම මිළ ගණන් සටහන්කරන ලද දැන්වීමක් පැහැදිලිව පෙනෙන සේ එම ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බවත් ;

(vii) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කොට ඇති යම ප්‍රදේශයකම පාන් විකුණන සැම කෙනෙකුම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ පාන් ගෙඩියේ විස්තරය ;

(ඇ) විකුණූ පාන් වල ප්‍රමාණය ;

(ඈ) විකුණූ පාන් වලට ගෙවූ මුදල ඇතුලත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(viii) තවද, "අවුන්ස" යනුවෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත අවුන්සයේ බර බවද, මෙම නියෝගයෙන් නියම කරමි.

1973 සැප්තැම්බර් මස 30 වෙනි දින පෙ.ව. 10.00 ට පොළොන්නරුව දිසාපති කාර්යාලයේ දී අත්සන් කරන ලදී.

එස්. ආර්. ඩබ්ලිව්. පී. අමරසිංහ,
පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක.

### උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>අවුන්ස 8 කට වඩා බර පාන් සඳහා අදල වැඩිම මිළ | රු. ශ. | 3 වැනි තීරය<br>අවුන්ස 8 ක් හෝ ඊට අඩු පාන් සඳහා අදල වැඩිම මිළ | රු. ශ. |
|---|---|---|---|---|
| පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කය ... ... ... ... | අවුන්ස 16 ක් | 0 80 ... | අවුන්ස 8 ක් | 0 40 |

**සැලකිය යුතුයි.**—මෙ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියම මිළ නොවේ. මෙවා එම ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිළ වේ. මේ මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැක.

10–280/2—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

මගේ අංකය : නිති/ණ/988.

(LE. 586)

**ජාතික නිවාස දෙපාර්තමේන්තුව**

උකස් කරනු ලැබූ ඉඩම්, ජාතික නිවාස ආඥාපනතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 401 වැනි පරිච්ඡේදය) අංක 76 දරණ වගන්තිය යටතේ හා 1966 අංක 36 දරණ (සංශෝධිත) පනත යටතේ විකිණීම සඳහා බලය දීම

ජාතික නිවාස ආඥාපනතේ අංක 9 (1) කී දරණ වගන්තිය යටතේ සහ එයට අදාල සංශෝධන පනත් යටතේ පත් කරනු ලැබූ, ජාතික නිවාස සහකාර කොමසාරිස් වන රෙගිස් ජයසුන්දරම් ජෝගේන්ද්‍ර වන මම ශ්‍රී ලංකා ජනරජය සඳහාත්, වෙනුවෙනුත් ක්‍රියා කරමින් ජෝසප් බර්ට්‍රම් පුවිමානසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරණ ලද 1967 ජූනි මස 04 දින අංක 1319 දරණ උකස්කරය යටතේ මුදල් ගෙවීම පැහැර ඇති බැවින්, කොළඹ මරදානේ මාලිගා වත්ත ලේන් හි අංක 70/16 හි කරීම් ඩීන් තාජුඩීන් මහතාගෙන් 1972.08.31 දිනතෙක් අයවිය යුතු රුපියල් එකොළොස් දහස් තුන්සිය පනස් දෙකයි ශත හැටහය (රු. 11,352.66) 72.07.04 දිනට පසු ගෙවන ලද මුදල් හැර අයකර ගැනීම සඳහාත්, එසේම 1972.08.31 දින සිට විකිණීම පැවැත්වෙන දිනය හෝ සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා තවදුරටත් වූ රුපියල් නමදාහක (රු. 9,000) ක මුදලක් සම්බන්ධයෙන් වන පොලී මුදල වර්ෂයකට සියයට පහමාර ප්‍රමාණයට යථෝක්ත උකස්කරය ප්‍රකාර 1972.08.31 දින සිට විකිණීමේ දිනය තෙක් එකතු වන සියලුම දඩ මුදල් සමග අයකර ගැනීමත්, එසේ අයකර ගැනීමේ දී දැරීමට සිදුවන වියදම් සහ ගාස්තු අයකර ගැනීම සඳහාත්, මීට අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති ඉඩම සහ එයට අදාල සියළුදේත්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිණිස ආඥා නිකුත් කර, එසේ විකිණීම සඳහා කොළඹ 12, උසාවිය පාරේ අංක 253 හි, ඇස්. ආර්. ඇල්. පෙරේරා ප්‍රසිද්ධ වෙන්දේසි කරුට බලය **දෙමි.**

ආර්. එස්. ජෝගේන්ද්‍ර,
ජාතික නිවාස සහකාර කොමසාරිස්.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවත,
කොළඹ 2,
1973 සැප්තැම්බර් මස 20 වන දින.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ රත්මලාන තලංගම සුළු නගර සහා සීමා ඇතුලත හේවාගම් කෝරළේ පල්ලෙ පත්තුවේ කලපළුවාවේ පිහිටි තක්සේරු අංක 25/24, මහවත්ත පාර බද දෙල් ගහවත්ත සහ වල්ජම්බුගහවත්ත නොහොත් මහයියාව එස්ටේට් (කොටස) නමැති ඉඩමේ බලපත්‍රධාරී මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සම්පාදිත 1960 සැප්තැම්බර් 15 වැනි දින අංක 571 පිඹුරේ 19 කට්ටිය සේ ලකුණු කර ඇත්තාවූත් එකී අංක 571 පිඹුරට අනුරූපව ප්‍රමාණයෙන් පර්චස් විසිදෙකක් (අ. 0, රූ. 0, ප. 22) අන්තර්ගතවූත් උතුරට: එම ඉඩමේම 20 කට්ටියෙන් ද; නැගෙනහිරට: එම ඉඩමේම 26 කට්ටියෙන් ද; දකුණට: එම ඉඩමේම 72 කට්ටියෙන් ද; බස්නාහිරට: එම ඉඩමේම 72 කට්ටියෙන් ද මායිම් වූත් ඊමත ඉදිකරන ලද නිවාසය සහ ඊමත ඇති ගස්වැල් වැවිලි පස සහ සැමදේ ද සහිතව බෙදා වෙන් කළ සහ නිරූපිත ඉඩම් කැබැල්ලේ සියල්ල, කොළඹ ඉඩම් ලියාපදිංචි කායසීලයේ ජී 286/197 වෙළුමේ ලියාපදිංචි කරන ලදී.

පහත දැක්වෙන්නාවූ පාරට ඇර තිබෙන බිම තුලින් දිගෙල්ලෙන් හෝ මතින් පයින් යාමේ සහ රථවාහන ගෙනයාමේ ගමන් අයිති යද කේබල් කම්බි සහ උඩුකම්බි සහ කසල කානු සහ ප්‍රධාන ජල නල මාර්ග සහ සම්බන්ධක සහ කොයියම්ම වර්ගයක හෝ ස්වරූපයක අනිකුත් උපාමාරුක නැංවීමේ, පිහිටුවීමේ සහ සවිකිරීමේ අයිතිය ද වේ.

එකී කලපළුවාවේ පිහිටි දෙල්ගහවත්ත සහ වල්ජම්බුගහවත්ත නොහොත් මහයියාව එස්ටේට් (කොටස) නමැති ඉඩමෙන් එකී අංක 571 පිඹුරේ 72 කට්ටිය සේ ලකුණු කර ඇත්තාවූත් උතුරට: 1, 19, 26, 27, 29, 30, 32 සිට 39 දක්වා 46 සිට 50 දක්වා 54, 45, 56, 57, 59, 60, 12, 13 කට්ටිවලින් සහ පාරෙන් ද; නැගෙනහිරට: 19 සිට 22 දක්වා 27 සිට 29 දක්වා 34 සිට 39 දක්වා 41 සිට 45 දක්වා 13 සිට 18 දක්වා සහ 70 කට්ටිවලින් ද; දකුණට: අඩිපාරෙන් 61 සිට 70 දක්වා 55, 58 සිට 60 දක්වා 41 සිට 45 දක්වා 50 සිට 54 දක්වා 18, 31 සහ 33 කට්ටිවලින් ද; බස්නාහිරට: 2 සිට 12 දක්වා 71, 61, 65, 58 සිට 60 දක්වා 46 සිට 50 දක්වා 51, 31, 33, 23 සිට 26 දක්වා කට්ටිවලින් ද මායිම්වූත් කොළඹ ඉඩම් ලියාපදිංචි කායසීලයේ ජී 322/49 වෙළුමේ ලියාපදිංචි කරන ලද එකී 571 පිඹුරට අනුරූපව ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් එකයි පර්චස් 6 ක් (අ. 1, රූ. 1, ප. 06) අන්තර් ගත වූත් එකී 72 කට්ටියයි බෙදා වෙන් කළ සහ නිරූපිත පංගුවේ සියල්ල.

10–296—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

**ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සේවා සංවිධානය—ගාල්ල**

**වාහන ගමනා ගමනයට බාධා කිරීම—උඩුගම- හිනිදුම පාරේ අංක 6/4 ලෑලි පාලමට අලාභහානිවීම**

ඉහත සඳහන් ලෑලි පාලමට අලාභහානි සිදුවී ඇති බැවින්, නැවත දන්වන තුරු සියලු රථවාහන ගමනාගමනය සඳහා එය වසා තබන බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

**මේ සඳහා විකල්ප පාරවල්**

1. ගාල්ල-දෙනියාය පාරේ 32 වන සැතපුම් කණුව අසල වල්පුද නැල්ල හංදියෙන් හැරී ඕපාත-තවලම හරහා හිනිදුම.
2. කළුතර-මතුගම-පැලවත්ත-නෙලුව-තවලම පාරේ හිනිදුම.

එස්. පත්මනාදන්,
වැඩ අධ්‍යක්ෂ.

දකුණු දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
කොටුව,
ගාල්ල.
1973. 09. 27 වන දින.

10-295—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

**කෑ/විද්‍යා ප්‍රකාශ පිරිවෙන—පිලාඹුව-වරකාපොල අස්ථිර වශයෙන් ලියාපදිංචි කිරීම**

ඉහත සඳහන් පිරිවෙන 1972.01.03 දින සිට රජයේ ආධාර ලබන පිරිවෙනක් ලෙස අස්ථිර වශයෙන් ලියාපදිංචි කල බව මෙයින් දන්වමි.

ඩී. බී. මල්ලිකාරච්චි,
කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

මගේ අංකය: කෑ/පාපාඋ/82.
1973 සැප්තැම්බර් මස 24 දින,
කෑගල්ල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

10-261—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| ඔක්තෝබර් ... | 73.10. 5 | සිකුරාද ... | 73. 9.28 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.10.12 | සිකුරාද ... | 73.10. 5 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.10.19 | සිකුරාද ... | 73.10.12 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.10.26 | සිකුරාද ... | 73.10.19 | සිකුරාද | දහවල් 12.00 |
| නොවැම්බර් ... | 73.11. 2 | සිකුරාද ... | 73.10.26 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.11. 9 | සිකුරාද ... | 73.11. 2 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.11.16 | සිකුරාද ... | 73.11. 9 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.11.23 | සිකුරාද ... | 73.11.16 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.11.30 | සිකුරාද ... | 73.11.23 | සිකුරාද | දහවල් 12.00 |
| දෙසැම්බර් ... | 73.12. 7 | සිකුරාද ... | 73.11.30 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.12.14 | සිකුරාද ... | 73.12. 7 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.12.21 | සිකුරාද ... | 73.12.14 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.12.28 | සිකුරාද ... | 73.12.21 | සිකුරාද | දහවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 අගෝස්තු මස 18 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.